# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2292/41 - 2022 අගෝස්තු මස 10 වැනි බදාදා - 2022.08.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදනයි

**2007 අංක 48 දරන විශෙෂ වෙළඳ භාණ්ඩ බදු පනත**

2 වැනි වගන්තිය සහ 5 වැනි වගන්තිය යටතේ නියමය

1. 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මම, මෙහි උපලේඛනයේ 1 වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන් එම උපලේඛනයේ 11 වන තීරයේ අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණය මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මඟින් පනවමි.

**උපලේඛනය**

| *1 වන තීරය* | | | | *11 වන තීරය* |
|---|---|---|---|---|
| | *වෙළඳ භාණ්ඩය* | | | *විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද* |
| | *සං. ව. ශීර්ෂය* | *සං. ව. සංකේතය* | *විස්තරය* | |
| 1. | 03.05 | 0305.54.10 | හාල්මැස්සන් | කි. ග්‍රෑමයට රු. 100/- |
| 2. | | 0305.52.00<br>0305.53.00<br>0305.54.90<br>0305.59.30<br>0305.59.90 | කරවල | කි. ග්‍රෑමයට රු. 100/- |
| 3. | 09.10 | 0910.99.10 | උළුහාල් ඇට | කි. ග්‍රෑමයට රු. 50 |
| 4. | 11.02 | 1102.90.20 | කුරක්කන් පිටි | කි. ග්‍රෑමයට රු. 150 |
| 5. | 12.07 | 1207.50 | අබ ඇට | කි. ග්‍රෑමයට රු. 62 |
| 6. | 25.01 | 2501.00 | ජලීය ආකාරයේ හෝ එසේ නොවන ආකාරයෙන් වූ හෝ එකතු කරන ලද කැටිනොගැසීමේ කාරකයෝ නිදහසේ පාවීම සඳහා වන ද්‍රව්‍යයන් අඩංගුවන්නා වූ, ශුද්ධ සෝඩියම් ක්ලෝරයිඩ් හෝ ලුණු (මේස ලුණු සහ ස්වාභාවික තත්ත්වය වෙනස් කළ ලුණු ඇතුළුව) මුහුදු ජලය | කි. ග්‍රෑමයට රු. 40 |

1A - PG 5928 — 481 (2022/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2. 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 5 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉහත උපලේඛනය මගින් දක්වා ඇති සංයෝජිත වර්ගීකරණ අංක 2501.00 යටතට වැටෙන ලුණු (Sodium Chloride B.P.) ආනයනය සඳහා අදාළ වන කිලෝ ග්‍රෑමයකට රු. 40 ක් වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන් කිලෝ ග්‍රෑමයකට රු. 10 ක් අයකරගෙන ඉතිරි වටිනාකම, ඖෂධ නිෂ්පාදනය සැපයීම් හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශයට යටත්ව, ජාතික ඖෂධ නියාමන අධිකාරිය (NMRA) යටතේ ලියාපදිංචි වාණිජ පරමාර්ථයෙන් තොරව ඖෂධ නිෂ්පාදනය කරන ඕනෑම ඖෂධ නිෂ්පාදන ආයතනයක් සඳහා අත්හරිනු ලැබිය යුතු බවට මෙයින් නියම කරනු ලැබේ.

3. මෙම නියමය 2022 අගෝස්තු මස 12 වැනි දින සිට ආරම්භ වන වසරක කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, වලංගුව පැවතිය යුතුය.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල් ආර්ථික ස්ථායිකරණ සහ ජාතික
ප්‍රතිපත්ති අමාත්‍ය.

2022 අගෝස්තු මස 10 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති
අමාත්‍යාංශයේ දී ය.

EOG 08-0132

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.